## සංක්ෂිප්තය

අ.පො.ස.(උසස්පෙළ) පන්ති මට්ටම තුළදී ඉතා ජනප්‍රිය විෂයක් ලෙස ආර්ථික විද්‍යාව විෂය දැක්වීමට පුළුවන. මෙම විෂය ජාතික මට්ටමේ ඇගයීම සිදු කිරීමේදී දක්නට ලැබුනේ සිසුන් විසින් ලබාගන්නාලද සාධන මට්ටම්හිදී විශාල පරාසයක විහිදුණු ලකුණු මට්ටම්වල සිටිනා බවය. මෙම විෂය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී එකිනෙක පාසල් විසින් විෂය මාලාවේ දක්වා ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයන්ට වඩා, සීමිත ඉගැන්වීම් ක්‍රමවේදයන්ට යොමු වී ඇති බවත් කරන ලද නිරීක්ෂණයන් තුළ දී අනාවරණය විය. මෙම අධ්‍යයනය තුළින් උත්සාහ කරනුයේ ආර්ථික විද්‍යාව විෂය ඉගැන්වීමේදී එසේ භාවිත කරනු ලබන සුවිශේෂ ඉගැන්වීමේ ක්‍රමවේදයන් මොනවාද, එසේ භාවිතා කරනු ලබන ක්‍රමවේද පිළිබඳ එය භාවිතා කරනු ලබන ගුරුවරුන්ගේ අදහස් කෙසේද යන්න විමසා බැලීමයි. මෙහිදී ලබාගත් නිගමන හා යෝජනා උපයෝගී කරගනිමින් ඉගැන්වීම් කාර්යයෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී තිබේද යන්න විමසා බැලේ.

මෙම නිබන්ධනයේ මුල් පරිච්ඡේදයෙන් අධ්‍යයනයේ පසුබිමත්, අධ්‍යයනයේ ඇති වැදගත්කමත්, අධ්‍යයනයේ අරමුණු පැහැදිලි කිරීමත් පද නිර්වචනය හා අධ්‍යයනයේ සීමා පිළිබඳවත් විස්තර කිරීම සිදුකර ඇත. ඒ තුළින් පර්යේෂකයා අධ්‍යයනය කරනු ලබන ගැටලුව පිළිබඳ යම් සුවිශේෂ හඳුන්වාදීමත් එහි ඇති වැදගත්කම් අනාවරණය කිරීමත් සිදුකර ඇත.

දෙවන පරිච්ඡේදයෙන් මාතෘකාවට අදාල වූ සාහිත්‍ය සමාලෝචනයක යෙදුණු අතර එහිදී ඉගැන්වීම් ක්‍රමශිල්ප පිළිබඳව දේශීය හා විදේශීය මූලාශ්‍ර වලින් තොරතුරු රැසක් ඉදිරිපත් කර ඇත. ආර්ථික විද්‍යාව විෂය සම්බන්ධයෙන් සිදුකර ඇති විදේශීය පර්යේෂණයන්ගෙන් ලබාගත් තොරතුරු ද දේශීය පර්යේෂණයන් මඟින් ලබාගත් තොරතුරු ද ඉදිරිපත් කර ඇත. එය පර්යේෂණය සඳහා දැනට කර ඇති පර්යේෂණවල හෙළිදරව් කිරීමක් වන අතර ඒ තුළින් ඉතා සුවිශාල කරුණු ප්‍රමාණයක් අනාවරණය සිදුකරන ලදි. එමගින් මෙම පර්යේෂණය සඳහා යම් මඟපෙන්වීමක් සිදුකරන ලදි.

අධ්‍යයනයේ අරමුණ හා නියැදිය පිළිබඳව විස්තර කෙරෙන තුන්වන පරිච්ඡේදයේදී දත්ත රැස්කිරීමේ ශිල්පීය ක්‍රම ශිල්පවල පවතින වැදගත්කම විස්තර කර ඇති අතර අධ්‍යයනයේ සීමාද දක්වා ඇත. මෙම අධ්‍යයනයේදී අනුගමනය කරන ලද ක්‍රියාදාමයන් එයට අනුව කරන ලද සැලසුම හා එය කොතරම් සාර්ථක වූයේද යන්න පිළිබඳ අනාවරණය සිදු කිරීම මේ තුළින් දක්වා ඇත.

හතරවන පරිච්ඡේදයේදී ලබාගත් දත්ත හා තොරතුරු විස්තරාත්මක ලෙස විශ්ලේෂණය කරන ලද අතර එහිදී ප්‍රශ්නාවලිය, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණය මගින් ලබාගත් තොරතුරු සංඛ්‍යානමය දත්ත විශ්ලේෂණ මෙන්ම ගුණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම අනුව විශ්ලේෂණය සිදුකරන ලදි. එය සිදු කිරීමේදී අනුගමනය කරනු ලැබූ පියවරයෙන් හා ප්‍රතිඵල සවිස්තරව මෙහි දක්වා ඇත.

පස්වන පරිච්ඡේදයෙන් පර්යේෂණ අධ්‍යයනය දියත් කිරීමේදී භාවිත කළ ඇගයීම් ශිල්ප ක්‍රම මඟින් ලැබුණු නිගමන වලට අනුව ගුරුවරුන්ගේ පන්ති කාමර ඉගැන්වීම් ක්‍රියාවලියට නූතන තාක්ෂණික ඉගැන්වීමේ ශිල්ප ක්‍රම උපයෝගී කරගත හැකි බවත් ගුරුවරයා තම කාර්යය නිසිලෙස ඉටු කිරීම සඳහා සිදුකළ යුතු කාර්යයන් රැසක්ද අනාවරණය කරගන්නා ලදි. මෙමඟින් අනාගත පර්යේෂණ අධ්‍යයනයන් සඳහා නව යෝජනා රැසක්ද හෙළිදරව් කිරීමට පර්යේෂකයාට හැකිවීමද සුවිශේෂ කරුණක් ලෙස ප්‍රකාශ කළ හැකිය.

## Summary

Economics is considered a very popular subject at the G.C.E. (Advanced Level) Arts and Commerce stream. When the A/L Economics subject was assessed at a national level examination, it was found that the marks obtained by students had high variation. However, it was seen that limited teaching methods had been used in order to teach the subject to students. Therefore, the purpose of this research is to find out the most popular teaching methods currently used by economic teachers at government schools and further obtain their opinions regarding the use of such methods.

The first chapter explains the background to the study, where it further elaborates the importance and aim of the study as well as defined the important concepts and limitations of the study. The second chapter explains the literature survey that includes both local and foreign research related to the topic. Furthermore, the recent research conducted on these teaching methods has been further evaluated and presented in this section.

The third chapter highlights the aim and the design of the research where it further elaborates the importance of selecting such methods such as collecting data and data analysis techniques. Limitations that were faced are also included and explained in this chapter.

The fourth chapter includes the results of the analysis of the data which was collected through questionnaires, interviews and observations quantitatively and qualitatively. These results have been presented in a percentage analysis that was carried out by the author.

Lastly, the fifth chapter includes the recommended solutions and conclusion of the research. It shows that modern technology can be used for class room teaching and that the teacher is capable of using many other methods to deliver the lessons successfully. This chapter has also been used to present many suggestions for future research as well.